# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2022.04.07

වර්ෂ 2022 ක් වූ අප්‍රේල් මස 07 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අප්‍රේල් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**<u>මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු</u>**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
14. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
15. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
16. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
17. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
18. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
19. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
20. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u> ඃ-**

**<u>01. 2022-03-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022-03-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022-03-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>(පෙ.ව 09.40ට ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

<u>(පෙ.ව 09.43ට ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)</u>

වටරක ප්‍රදේශයේ ගම්වාසීන් පිරිසක් මහා සභා රැස්වීම පැවති භූමියට පැමිණ විරෝධතාවයක නිරත වූ බැවින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් පෙ.ව 09.45ට අඩාලව කල් තබන ලද මහා සභා රැස්වීම පෙ.ව 10.25ට නැවත ආරම්භ කරන ලදී.

(පෙ.ව 10.25ට ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

සභා වාර්තාව සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම මගින් ගරු සභිකවරුන්ගේ අදහස් දැක්වීම් යටපත්වීම සිදුවන බවට ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභා වාර්තාවට විරුද්ධ විය.

(පෙ.ව 10.55ට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

2022-03-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන රහිතව යටත්ව බහුතරයෙන් සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන ඃ-**

හිරිඹුරගම සුමුදු පෙර පාසලේ පෙර පාසල් පාලිකාව වෙත දෛනික වැටුප් ලබා දෙන ක්‍රමය වෙනස් කර දෙන ලෙස ඉල්ලීමක් කොට ඇති බැවින් ඒ සඳහා ඉදිරි මහා සභා රැස්වීමේදී විධිමත් සභා තීන්දුවක් ලබා ගැනීමට බලාපොරොත්තු වන බවට සභාව දැනුවත් කරන ලද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඊ සභා ජංගම මෘදුකාංගය හඳුන්වාදීමේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් 2022-04-08 වන දින ප.ව 02.00ට අප ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බැවින් ඒ සඳහා සහභාගි වන ලෙස ගරු උප සභාපතිතුමා ඇතුළු සියළුම ගරු සභිකවරුන් වෙත ආරාධනා කරන ලදී.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** මීපාවල උප කාර්යාලයේ තාප්පයේ ඉතිරි වැඩ කොටස් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම අවස්ථාවේදී ප්‍රධාන සංවර්ධන යෝජනා කිහිපයක් ක්‍රියාත්මක වන බැවින් මේ සඳහා ඇස්තමේන්තුවක් සකස්කොට නොමැති නම් මෙම කාර්යය සිදු කිරීම පසුවට කල් තැබීම සුදුසු බවට ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(පෙ.ව 11.00ට ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

උප කාර්යාලයේ ගේට්ටුව දෙපස කොටස් සංවර්ධනය කිරීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, ඒ සඳහා රු.25,000.00ක පමණ මුදලක් වැයවිය හැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව මීපාවල උප කාර්යාලයේ තාප්පයේ ඉතිරි වැඩ කොටස් සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.** 2021-12-31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ පරිදි වෙන්දේසි කරන ලද සහ විනාශ කරන ලද උපකරණ පොත් වලින් කපා හැරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව 2021-12-31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ පරිදි වෙන්දේසි කරන ලද සහ විනාශ කරන ලද උපකරණ පොත් වලින් කපා හැරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**03.** හපුගල, සරසවි අසපුවේ සමන් ලියනගේ මහතාගේ නිවස අසළ මාර්ගය අඩි දෙකක විශ්කම්භය ඇති අඩි අටක් දිග සිලින්ඩර දෙකක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව හපුගල, සරසවි අසපුවේ සමන් ලියනගේ මහතාගේ නිවස අසළ මාර්ගය අඩි දෙකක විශ්කම්භය ඇති අඩි අටක් දිග සිලින්ඩර දෙකක් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**04.** හෝම් ලැන්ඩ්ස් (පුද්) සමාගම විසින් සිදුකරන ලද හපුගල කිංස්ටන් පාර්ක් ඉඩම් ව්‍යාපෘතිය සඳහා නල ජලය ලබා දීම වෙනුවෙන් තාවකාලිකව ඉදිකරනු ලැබූ ජල ව්‍යාපෘතියට අදාළ කටයුතු 2017 වර්ෂයේදී අවසන් කර ඇති බැවින් සහ ඉඩම් කැබලි මිල්දීගත් ගැනුම්කරුවන් වෙත 2020 වර්ෂයේදී ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය හරහා නල ජල සැපයුම ලබා දී ඇති බැවින් එම ආයතනය විසින් නල ළිඳ ඉදිකරන ලද පර්චස් 2.7ක විශාලත්වය ඇති කැබලි අංක 25 දරණ බිම් කොටස නැවත හෝම් ලැන්ඩ්ස් (පුද්) සමාගම වෙත නිදහස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කරන ලදී.

මෙම වෙන්දේසි ඉඩමේ කසළ රැස්කිරීම සඳහා බිම් කොටසක් වෙන් කර නොමැති නම් මෙම බිම් කොටස ඒ සඳහා වෙන් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(පෙ.ව 11.05ට ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

මෙම බිම් කොටස ගාල්ල - වක්වැල්ල ප්‍රධාන මාර්ගයට මුහුණලා හපුගල ඉංජිනේරු පීඨය ආසන්නයේ පිහිටා ඇති ඉඩම් කොටසක් බවත්, මෙම වෙන්දේසි ඉඩමේ ඉඩම් කැබලි 10ක පමණ ප්‍රමාණයක් ඇති බවත්, ප්‍රධාන මාර්ගයකට මුහුණලා පිහිටි ඉඩම් කොටසක් කසළ රැස්කිරීම සඳහා වෙන්කිරීම ගැටළුකාරී බවත්, මෙම ඉඩම් කොටස තව මාස කිහිපයකින් සභාවට පැවරීමට නියමිත බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම වෙන්දේසි ඉඩමේ පදිංචිකරුවන්ගේ කසළ බැහැර කිරීම සඳහා මෙම ඉඩම් කොටස වෙන් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත යෝජනාව ස්ථිර කිරීමක් සිදු නොකළ බැවින් සභා සම්මත වීම සිදු නොවීය.

**05.** කලේගාන ප්‍රධාන කාර්යාලයේ වක්වැල්ල මාර්ගයට මුහුණලා ඇති දකුණුපස ගේට්ටුව අසළ ලංකා විදුලි බල මණ්ඩලයට කණු සිටුවීමට සහ උප පොළක් ඉදිකිරීමට අවසරය ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කරන ලදී.

විදුලිය විසන්ධිවීම් වලට ප්‍රාදේශීය සභාව නිරන්තරයෙන් ලක්වන බැවින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කොට ප්‍රාදේශීය සභාව සතු ඉඩමේ කෙළවරේ ට්‍රාන්ස්පෝමරයක් සවි කිරීමට ලංකා විදුලි බල මණ්ඩලය විසින් ඉල්ලීමක් සිදුකොට ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සභාව ඉදිරිපිට ට්‍රාන්ස්පෝමරයක් ඉදිකිරීමෙන් අප ප්‍රාදේශීය සභාව අවලස්සන වීමක් සිදුවන බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම මතයේ තමාද සිටින බවත්, විදුලි බල මණ්ඩලය මහ ජනතාව වෙනුවෙන් මෙම ඉල්ලීම සිදුකොට ඇති බවත්, මහ ජනතාව සම්බන්ධව සභාවටද වගකීමක් ඇති බවත්, මේ සම්බන්ධව තවදුරටත් සාකච්ඡා කොට ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කොට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ලබා ගැනීමට බලාපොරොත්තු වන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ඉහත යෝජනාව ස්ථිර කිරීමක් සිදු නොකළ බැවින් සභා සම්මත වීම සිදු නොවීය.

(පෙ.ව 11.07ට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**06.** අප ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන කලේගාන අරුණළු පෙර පාසලේ සහ හිරිඹුරගම සුමුදු පෙර පාසලේ ළමුන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එක් ළමයෙකුට එක් දිනක් සඳහා රු.30.00ක මුදලක් වෙන් වී ඇති නමුත් වෙළඳපොළෙහි ආහාර ද්‍රව්‍ය වල මිල ගණන් අනුව මෙම මුදලට සැපයුම්කරුවන් ඉදිරිපත් නොවන බැවින් මෙම ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා එක් ළමයෙකුට එක් දිනක් සඳහා රු.25.00ක මුදලක් බැගින් සභා අරමුදලින් ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මුදලටද පෙර පාසල් ළමයෙකු හට ආහාර වේලක් ලබාදීමද අසීරු කාර්යයක් බවට ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම මුදලටද පෙර පාසල් ළමයෙකු හට ආහාර වේලක් ලබාදීමට අපහසුතා තිබුණද මෙම කාර්යය සභාවේ දායකත්වය සහිතව සිදු කරනු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන කලේගාන අරුණළු පෙර පාසලේ සහ හිරිඹුරගම සුමුදු පෙර පාසලේ ළමුන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එක් ළමයෙකුට එක් දිනක් සඳහා රු.30.00ක මුදලක් වෙන් වී ඇති නමුත් වෙළඳපොළෙහි ආහාර ද්‍රව්‍ය වල මිල ගණන් අනුව මෙම මුදලට සැපයුම්කරුවන් ඉදිරිපත් නොවන බැවින් මෙම ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා එක් ළමයෙකුට එක් දිනක් සඳහා රු.25.00ක මුදලක් බැගින් සභා අරමුදලින් ලබාදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**07.** අප ප්‍රාදේශීය සභාවට අයත් ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 08, 14, 23, 33 සහ 34 කඩහිමියන් මාසික බදු මුදල් නොගෙවීම නිසා බදු ගිවිසුමේ කොන්දේසි කඩ කර ඇති බැවින් මෙම කඩ කාමර පහ මුද්‍රා තබා සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවට අයත් ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 08, 14, 23, 33 සහ 34 කඩහිමියන් මාසික බදු මුදල් නොගෙවීම නිසා බදු ගිවිසුමේ කොන්දේසි කඩ කර ඇති බැවින් මෙම කඩ කාමර පහ මුද්‍රා තබා සභාවට පවරා ගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**08.** රට තුළ පවතින විදුලි අර්බුදය පහව යනතෙක් අත්‍යාවශ්‍ය නොවන වීදි පහන් නඩත්තු නොකර සිටීමට සහ අත්‍යාවශ්‍ය නොවන ස්ථාන වලට අළුතෙන් වීදි පහන් කට්ටල සවිකිරීමෙන් වැළකී සිටීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව රට තුළ පවතින විදුලි අර්බුදය පහව යනතෙක් අත්‍යාවශ්‍ය නොවන වීදි පහන් නඩත්තු නොකර සිටීමට සහ අත්‍යාවශ්‍ය නොවන ස්ථාන වලට අළුතෙන් වීදි පහන් කට්ටල සවිකිරීමෙන් වැළකී සිටීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**09.** බැහැර දී ඇති නමුත් දිගු කාලයක් තුළ නොලැබූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පත්කල හානි පාඩු කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව බැහැර දී ඇති නමුත් දිගු කාලයක් තුළ නොලැබූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පත්කල හානි පාඩු කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(පෙ.ව 11.10ට ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**10.** අප ප්‍රාදේශීය සභාවේ වසර දෙක ඉක්මවූ පහත දක්වා ඇති තැන්පත් මුදල් සභා ආදායමට ගැනීමට යෝජනා කරමි.

- ආරක්ෂක ඇප තැන්පත් - රු.59,450.00
- සාමාන්‍ය ඇප තැන්පත් - රු.498,800.00
- කර්මාන්ත ඇප තැන්පත් - රු.99,860.10
- ටෙන්ඩර් ඇප තැන්පත් - රු.5,000.00

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අප ප්‍රාදේශීය සභාවේ තැන්පත්කොට ඇති නමුත් වසර දෙකක කාලයක් ඇතුළත ලබා නොගත් තැන්පත් මුදල් සභා අරමුදලට යොමු කරවීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවේ වසර දෙක ඉක්මවූ පහත දක්වා ඇති තැන්පත් මුදල් සභා ආදායමට ගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

- ආරක්ෂක ඇප තැන්පත් - රු.59,450.00
- සාමාන්‍ය ඇප තැන්පත් - රු.498,800.00
- කර්මාන්ත ඇප තැන්පත් - රු.99,860.10
- ටෙන්ඩර් ඇප තැන්පත් - රු.5,000.00

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා**

**11.** හිරිඹුර, පැතුම් උයන බාන් මහතාගේ නිවස අසළ කාණුව තමාගේ පෞද්ගලික කාණු සකසා පිඹුරුපත් ඇඳ සභාවට වෙන්කර දී ඇති බැවින් එම භූමියේ අනෙකුත් ඉඩම් කොටස් අනුමත කර දීම නිසා බාන් මහතාට මතු වී ඇති ගැටළුව සඳහා සුදුසු විසඳුමක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ස්ථානයේ ඉඩම් කැබලි 10ක් පමණ ඇති බවත්, මේ සඳහා අප ප්‍රාදේශීය සභාවෙන්ද නඩුවක් ගොනුකර ඇති බවත්, තනි පුද්ගලයෙකුට විරුද්ධව ක්‍රියාකිරීම සුදුසු නොමැති බැවින් මේ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත්, මෙහි වැට මායිම් ගැටළුවක් ඇති බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළුව සඳහා සභාවෙන් නඩු පවරා ඇති බවත්, මෙම ස්ථානයේ කාණුවක ගැටළුවක් ඇති බවත්, මෙම ගැටළුව විසඳාගැනීම සඳහා කාන්තාවක් දිගින් දිගට සභාව වෙත පැමිණි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම කාන්තාවගේ ඉඩමේ මායිම් නිවැරදි කර ගැනීම සඳහා නඩුවක් පවරා තිබුණ බවත්, එම කාන්තාව සභාව වෙත පැමිණ බලපෑම් කොට සභාව හරහා මෙම ගැටළුවට නඩුවක් පවරා තමාගේ මායිම් සම්බන්ධව පැවති නඩුව ඉල්ලා අස්කර ගත් බවත්, මේ වන විට සභාව විසින් මෙම පුද්ගලයාට විරුද්ධව නඩු පවරා ඇති බවත් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ යුතු බවත්, මැයි මස 12 වන දින මෙම නඩුවේ තීන්දුව ලබා දීමට නියමිත බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සභාවෙන් නඩු පවරා ඇත්තේ අනවසර ඉදිකිරීමක් සඳහා බවත්, එම නිසා අනවසර ඉදිකිරීම කඩා ඉවත් කිරීමට නඩු තීන්දුව ලබා දීමට ඉඩ ඇති බවත්, කාණුවක් ඉල්ලා සිටි නිසා මෙම පුද්ගලයා විසින් කාණුවක් කපා සැලසුමක් සකස්කොට ඇති බවත් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභා තීන්දුවක් ලබාගෙන මෙම නඩු පවරා ඇති බවත්, නඩු තීන්දුව බලා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම හෝ සභා තීන්දුවක් ලබාගෙන නඩුව ඉල්ලා අස්කර ගත යුතු බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

නඩුව ඉල්ලා අස්කර ගැනීමට හැකියාවක් නොමැති බවත්, ගොවිජන සේවා ආයතනයේ නිර්දේශ ලබාගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ලබාගත යුතු බවත් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාවෙන් පවරා ඇති නඩු ඉල්ලා අස්කර ගැනීමට අවශ්‍යතාවයක් නොමැති බවට ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉල්ලා ඇති කාණුව මේ වන විට කපා ඇති බවත්, මේ වන විට ඒ ආසන්නයේ ඇති අනෙකුත් ඉඩම් අනුමත කොට ඇති බවත් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අනවසර ඉදිකිරීමක් සඳහා නඩු පවරා නඩුව ඉල්ලා අස්කර ගැනීම සුදුසු නොවන බවත්, මේ පිළිබඳව සාකච්ඡා කොට ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව හිරිඹුර, පැතුම් උයන බාන් මහතාගේ නිවස අසළ කාණුව තමාගේ පෞද්ගලික කාණු සකසා පිඹුරුපත් ඇඳ සභාවට වෙන්කර දී ඇති බැවින් එම භූමියේ අනෙකුත් ඉඩම් කොටස් අනුමත කර දීම නිසා බාන් මහතාට මතු වී ඇති ගැටළුව සඳහා සුදුසු විසඳුමක් ලබා දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**12.** ගොඩකන්ද, උළුවිටිකේ මාර්ගයේ ජලය බැසයන කාණු පද්ධතිය අවහිරවීම නිසා ජලය මාර්ගය හරහා ගමන් කිරීමෙන් මාර්ගයට ද දැඩි හානි සිදුව ඇති බැවින් මාර්ගය දෙපස කාණු පද්ධතිය පිරිසිදු කිරීමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව ගොඩකන්ද, උළුවිටිකේ මාර්ගයේ ජලය බැසයන කාණු පද්ධතිය අවහිරවීම නිසා ජලය මාර්ගය හරහා ගමන් කිරීමෙන් මාර්ගයට ද දැඩි හානි සිදුව ඇති බැවින් මාර්ගය දෙපස කාණු පද්ධතිය පිරිසිදු කිරීමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**13.** කරාපිටිය ගොඩකන්ද මාර්ගයේ අනතුරුදායක ලෙස පිහිටා ඇති කොට්ටම්බා ගස සභා අරමුදලෙන් කපා අනතුර ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කරාපිටිය හන්දියෙන් ගොඩකන්ද පාරට හැරෙන ස්ථානයේ මෙම කොට්ටම්බා ගස පිහිටා ඇති බවත්, එම ගස මේ වන විට දිරාපත් වී ඇති බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව කරාපිටිය ගොඩකන්ද මාර්ගයේ අනතුරුදායක ලෙස පිහිටා ඇති කොට්ටම්බා ගස සභා අරමුදලෙන් කපා අනතුර ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

රසායනික පොහොර ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇති බැවින් 14වන යෝජනාව යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**15.** හිරිඹුරගම ප්‍රජා ශාලාව අසළ මාර්ගය මතින් ජලය ගලා යාම නිසා මාර්ගයට දැඩි හානි සිදුවන බැවින් එම ස්ථානය සඳහා හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව හිරිඹුරගම ප්‍රජා ශාලාව අසළ මාර්ගය මතින් ජලය ගලා යාම නිසා මාර්ගයට දැඩි හානි සිදුවන බැවින් එම ස්ථානය සඳහා හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**16.** ජස්ටින් කන්ද, ඩී.ජී. ජිනදාස මහතාගේ නිවස අසළ මාර්ගයේ ජලය ගලා ඒම නිසා අනතුරුදායක තත්ත්වයට පත්ව ඇති බැවින් මාර්ගයේ ආරක්ෂාව සඳහා සභාවේ කම්කරු මහතුන් හා ගම්වැසියන්ගේ දායකත්වයෙන් පැති බැම්මක් ඉදිකරදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ප්‍රදේශවාසීන්ගෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගෙන සභාවේ කම්කරුවන්ගේ ශ්‍රම දායකත්වය ලබා දී මෙම බැම්ම ඉදිකිරීමට හැකි බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා කල් ඇතිව දැනුම් දෙන ලෙසත්, එවිට සභාවේ සේවකයන් යෙදවිය හැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ජස්ටින් කන්ද, ඩී.ජී. ජිනදාස මහතාගේ නිවස අසළ මාර්ගයේ ජලය ගලා ඒම නිසා අනතුරුදායක තත්ත්වයට පත්ව ඇති බැවින් මාර්ගයේ ආරක්ෂාව සඳහා සභාවේ කම්කරු මහතුන් හා ගම්වැසියන්ගේ දායකත්වයෙන් පැති බැම්මක් ඉදිකරදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**17.** ගොඩකන්ද, කුකුලගහ ඇළ සුද්ධ පවිත්‍ර කරන ලෙස පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දන්වා යවන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ගොඩකන්ද, කුකුලගහ ඇළ සුද්ධ පවිත්‍ර කරන ලෙස පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දන්වා යවන මෙන් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා

**18.** ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල භාරයේ ඇති රත්නගිරිවත්ත ක්‍රීඩා පිටිය සහ ප්‍රජාශාලා භූමිය අප ප්‍රාදේශීය සභාවට පවරාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල භාරයේ ඇති රත්නගිරිවත්ත ක්‍රීඩා පිටිය සහ ප්‍රජාශාලා භූමිය අප ප්‍රාදේශීය සභාවට පවරාගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**19.** ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල භාරයේ ඇති රත්නගිරිවත්ත - පැලවත්ත පොදු සුසාන භූමිය අප ප්‍රාදේශීය සභාවට පවරාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල භාරයේ ඇති රත්නගිරිවත්ත - පැලවත්ත පොදු සුසාන භූමිය අප ප්‍රාදේශීය සභාවට පවරාගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**20.** නරාවල, කාසල්වත්ත ගම්මානයේ උදාන මහතාගේ නිවස අසළ මාර්ගයේ ජල සැපයුම සැපයීමට සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා කාණු කැපීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නරාවල, කාසල්වත්ත ගම්මානයේ උදාන මහතාගේ නිවස අසළ මාර්ගයේ ජල සැපයුම සැපයීමට කාණු කැපීමට සහ නරාවල කාසල්වත්ත ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු සඳහා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය සහ ට්‍රැක්ටර් රථයක් යෙදවීමට ලෙස මෙම යෝජනාව සඳහා සංශෝධනයක් ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

එම සංශෝධනය ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී සංශෝධිත යෝජනාවට අදාළව නරාවල, කාසල්වත්ත ගම්මානයේ උදාන මහතාගේ නිවස අසළ මාර්ගයේ ජල සැපයුම සැපයීමට කාණු කැපීමට සහ නරාවල කාසල්වත්ත ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු සඳහා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය සහ ට්‍රැක්ටර් රථයක් යෙදවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**(පෙ.ව 11.15ට තේ පානය සඳහා කල් තබන ලද මහා සභා රැස්වීම පෙ.ව 11.35ට නැවත ආරම්භ කරන ලදී.)**

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ-</u>**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2022-03-22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කමිටු වාර්තාවල තමා පෙන්වාදුන් අඩුපාඩු නිවැරදි වනතෙක් කමිටු වාර්තාවලට තමා විරුද්ධ බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම වාර්තාව බහුතරයෙන් සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**I.** 2022-03-22 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ මාර්තු මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ මාර්තු මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

2022 වර්ෂයේ මාර්තු මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**04. වෙනත් ලේඛන ඃ-**

**(උ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**2022 වර්ෂයේ අප්‍රේල් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.**

වටරැක ප්‍රදේශයේ මතු වූ ගැටළුව සඳහා ඉක්මණින් ඇස්තමේන්තුවක් සකස්කොට එම කාර්යය සිදු කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් එම කාර්යය සෘජු ශ්‍රමික පදනම මත සිදු කිරීමට ඇති හැකියාව පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභා අවස්ථාවක් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**කාරක සභා අවස්ථාව**

ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල ඉහළ යාම නිසා සහ ශ්‍රම පහසුකම් සපයාගැනීම සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවීම නිසා දැනට පවතින මිල ගණන් (රේට්ස්) යටතේ සෘජු ශ්‍රමික පදනම මත සංවර්ධන කටයුතු සිදු කිරීමට බාධා ඇති බවට කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරී ඒ.පී.පී.එස්. ගුණසේකර මහතා විසින් අදහස් දක්වා සිටින ලදී.

කාරක සභා අවස්ථාව අවසන් කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය සම්බන්ධව ගැටළුකාරී තත්ත්වයක් ඇති ඉඩම මේ වන විට සුද්ධ පවිත්‍ර කොට වැට කම්බි ගසා වෙන්කොට ඇති බැවින් ඒ සඳහා සභාවේ අවධානය යොමු කරන ලෙස ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම කාර්යය සඳහා සභාවේ අවසරයක් ලබාගෙන නොමැති බවත්, මේ සඳහා දැන්වීම් දෙකක් සකස්කොට එම ස්ථානයේ සවි කිරීමට කටයුතු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

වටරැක චලක ගරාජය අසළ කාණුව ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මෙන්ම ප්‍රාදේශීය සභාව හරහාද කටයුතු සිදුකිරීමට තමා මැදිහත් වුවද එය ඉටුකර ගැනීමට නොහැකි වූ බවත්, කලේගාන කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සඳහා ගරු සභාපතිතුමා සහ ලේකම්තුමා තමා වෙත සහයෝගය ලබා දුන් බවත් ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කලේගාන කොට්ඨාශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන අවසන්වීම නිසා වටරැක ගැටළුකාරී තත්ත්වයක් ඇති කාණුව සංවර්ධනය කිරීම ප්‍රමාද වූ බවත්, මින් පසු සංවර්ධන කටයුතු සිදු කරන විට ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන ලෙසත්, සභාව හරහා ඉටුවිය යුතු කාර්යයන් සිදු නොකිරීමේ වගකීම සභාව භාරගත යුතු බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(පෙ.ව 12.05ට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රී කාංචනා මැතිණිය, ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා, ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

අනුර රණධීර මහතාගේ ගැටළුව ඔම්බුඩ්ස්මන්වරයා හමුවට සහ මානව හිමිකම් කොමිසන් සභාව වෙත පවා ගිය බවත්, මෙම ගැටළුව නිසා එම මහතාට හානියක් සිදුවූ බවත්, එම ගැටළුව විසඳීම සඳහා ඇස්තමේන්තුවක් සකස්කොට ඇති බවට දැනුම් දී ඇති බැවින් එම ගැටළුව විසඳීම සඳහා සභාව මැදිහත් විය යුතු බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු :- නැත. (සියළුම ගරු සභිකවරු මහා සභා රැස්වීමට සහභාගි විය.)**

**සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

මීළඟ මහා සභා රැස්වීම 2022-05-18 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීමේ කටයුතු ප.ව 12.15 ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.